**ජාතික යොවුන් සේනාංකය - 2017**

**-------------------------------------------**

ජාතික යොවුන් සේනාංකයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2002 අංක 21 දරන ජාතික යොවුන් සේනාංක පනතේ 17 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර සේනාංකයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ)වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සේනාංකයේ සභාපති වෙත 2019 ජනවාරි 07 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සේනාංකයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සේනාංකයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ විගණන මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික යොවුන් සේනාංකයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

ප්‍රමිතයේ 69 ඡේදය ප්‍රකාරව, වාර්තාකරණ දිනයෙන් පසු සාධාරණ කාලපරිච්ඡේදයක් තුළදී ඒවා පරිශීලකයින්ට ලබා නොදෙන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රයෝජනවත්භාවය හානිකරණයට භාජනය වේ. ඒ අනුව අස්ථිත්වයට වාර්තාකරණ දිනයෙන් මාස 06 ක කාලයක් තුළදී එහි මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමේ හැකියාව තිබිය යුතු වුවත් ජාතික යොවුන් සේනාංකයේ 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කර තිබුණේ 2018 නොවැම්බර් 26 දිනදීය.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

(i) ප්‍රමිතයේ 24 ඡේදය ප්‍රකාරව, වත්කමක් ලෙස හඳුනා ගැනීමට සුදුසුකම් ලබන දේපල, පිරියත හා උපකරණ අයිතමයක් එහි පිරිවැයට මැනිය යුතු වුවත් රු.358,906 ක ප්‍රමාද ගාස්තු අඩු කර පරිගණක උපකරණ හා ලී බඩු උපකරණ තොගයක් ගිණුම්ගත කර තිබුණි.

(ii) ප්‍රමිතයේ 69 ඡේදය ප්‍රකාරව, වත්කමක ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීම සඳහා සුදානම් තත්ත්වයට ගෙන ආපසුය. එහෙත් ඊට අනුකූල නොවන ලෙස සමාලෝචිත වර්ෂයේ අවසන් කාර්තුව තුළදී මිලදී ගෙන තිබූ රු.74,424,177 ක් වටිනා වත්කම් මිලදී ගත් දිනය නොසලකා සම්පූර්ණ වර්ෂයටම ක්ෂය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල ක්ෂය රු.13,902,711 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

## 2.2.2. ගිණුම්කරණ ප්‍රතිපත්ති

---------------------------

සේනාංකයේ මූල්‍ය ප්‍රකාශන අනුව, තොග පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් අඩු අගයට ගිණුම් තබන බව ගිණුම් ප්‍රතිපත්ති යටතේ දක්වා තිබුණි. නමුත් මූල්‍ය ප්‍රකාශනවල තොග යටතේ විසිර යාමේ නිල ඇඳුම්වල පිරිවැය වටිනාකම වූ රු.70,842,753 ක් දක්වා ඇතත් මෙම නිල ඇඳුම් වර්ෂයට දෙවරක් භාවිතා කර ගබඩාවට භාර දෙනු ලබන විසිර යාමේ කාර්යය සඳහා පමණක් භාවිතා කරන නිල ඇඳුම් තොගයක් බව නිරීක්ෂණය විය. ඒ අනුව මෙම තොගයේ ශුද්ධ උපලබ්ධි වටිනාකම හඳුනාගෙන නොමැති වීම හේතුවෙන් එම තොගයේ සාධාරණ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් නිරූපනය නොවන බව නිරීක්ෂණය විය.

## 2.2.3. ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයට අදාල රේන්ජර් දීමනා රු.1,201,350 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ රේන්ජර් දීමනා රු.404,100ක් හා ආහාර දීමනා රු.370,425 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සේනාංක මූලස්ථාන පරිශ්‍රයේ වූ ආපනශාලා ගොඩනැගිල්ල 2017 සැප්තැම්බර් 20 දින සිට 2018 අගෝස්තු 17 දක්වා කාලපරිච්ඡේදයේදී මාසික කුලිය රු.35,555 කට කුලියට ලබාදී තිබුණත් එම කුලී ආදායම ගිණුම්ගත නොකර සේනාංකයේ සුභසාධක සංගමයට ලබාදී තිබුණි.

(ඇ) 2015 වර්ෂයේ සිට 2017 දක්වා වූ වර්ෂවලට අදාලව විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද වැඩසටහනක් වෙනුවෙන් දරන ලද රු.270,228 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) ගිණුම්කරණ පද්ධතියේ හඳුනා නොගත් වැරදි ලෙස අවස්ථා 4 කදී එකතුව රු.122,056 ක් තැන්පතු යටතේ ගිණුම්ගත කර තිබූ නමුත් එම වැරදි හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි.

(ඊ) උපචිත වියදම් ලෙස රු.53,400 ක් දෙවරක් ගිණුම්ගත කර තිබුණි.

## 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම්

---------------------------------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලදී ලබා ගත් භාණ්ඩ හා සේවා වෙනුවෙන් වියදම් සනාථ කරන ලිඛිත සාක්ෂි නොමැතිව රු.1,672,945 ක් උපචිත වියදම් ලෙස දක්වා තිබුණි.

## 2.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන හා විගණනයට ඉදිරිපත් කරන ලද උපලේඛන සැසඳීමේදී ගිණුම් විෂයයන් දෙකකට අදාලව එකතුව රු.5,355,053 ක වෙනසක් නිරීක්ෂණය විය.

| විස්තරය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | උපලේඛනය අනුව වටිනාකම | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ආහාර දීමනාව | 193,325,925 | 188,293,768 | 5,032,157 |
| ධාරිතා සංවර්ධනය | 7,559,043 | 7,881,939 | 322,896 |
| | | | 5,355,053 |

**2.3 ලැබිය යුතු ගිණුම්**

විදුලිය හා ජල ගාස්තු වෙනුවෙන් බාහිර ආයතනයකින් සමාලෝචිත වර්ෂය සඳහා අයකරගත යුතු රු.2,393,538 ක් ද 2015 සහ 2016 වර්ෂ සඳහා රු.4,362,278 ක්ද වශයෙන් එකතුව රු.6,755,816 ක්, 2017 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 2002 අංක 21 දරන යොවුන් සේනාංක පනත | |
| (i) 1 වගන්තිය | පනත ප්‍රකාරව, ආයතනය "යොවුන් සේනාංක" ලෙස නම්කර තිබූ නමුත් මූල්‍ය ප්‍රකාශනවල ජාතික යොවුන් සේනාංකය ලෙස දක්වා තිබුණි. |
| (ii) 2(4) වගන්තිය | යොවුන් සේනාංක සභාවේ කටයුතු පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෘත්තිය පුහුණුව, යොවුන් සංවර්ධනය සහ ස්ථාපනය යන කාර්ය සඳහා කමිටු තුනක් පත් කර නොතිබුණි. |
| (iii) 19 වගන්තිය | බඳවා ගතයුතු පුහුණුලාභීන්ගේ වයස අවුරුදු දහඅටට නොඅඩු සහ විසි අටට නොවැඩි තැනැත්තන් විය යුතු වුවත් අවුරුදු දහඅටට අඩු වයස් සීමාවේ පසුවන්නන් බඳවාගෙන තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මුදල් රෙගුලාසි 571 | වර්ෂ 2 ක් ඉක්මවූ තැන්පතු ආදායමට බැර කළ යුතු වුවත් 2013 වර්ෂයේ සිට පැවත එන එකතුව රු.215,066 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

(ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

---

(i) 6.5.1 වගන්තිය — මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කළ යුතු කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 9.5.1 වගන්තිය — කාර්යමණ්ඩල පුහුණුව සඳහා අයවැයක් සකස් කර ඒ සඳහා අරමුදල් සම්පාදනය කළ යුතු බව දක්වා තිබූ නමුත් සේනාංකය විසින් පුහුණු කටයුතු සඳහා අයවැයක් සකස් කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සේනාංකයේ මූල්‍ය ප්‍රතිඵලය රු.68,469,997 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.44,601,282 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.113,071,279 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.187,681,721 කින් වැඩි වී තිබුණද වියදම රු.300,753,000 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 02 ක ආයතනයේ මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2015 වර්ෂයේදී රු.11,053,605 ක ඌනතාවයක් සහ 2016 වර්ෂයේදී රු.44,601,282 ක අතිරික්තයක් ඇති වී තිබූ අතර නැවතත් සමාලෝචිත වර්ෂයේදී රු.68,469,997 ක ඌනතාවයක් ඇති වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම්වලට අදාල ක්ෂය නැවත ගැලපීමේදී 2015 වර්ෂයේදී රු.275,073 ක් වූ සේනාංකයේ දායකත්වය 2016 වර්ෂයේදී රු.415,732,341 ක් දක්වා වැඩි වී තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේදී රු.409,920,173 ක් දක්වා අඩු වී තිබුණි.

### 3.2 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

ඉකුත් වර්ෂයේ ජංගම හා ක්ෂණික අනුපාතය පිළිවෙලින් 1.57 ක් හා 1.03 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ පිළිවෙලින් 6.58 ක් හා 5.40 ක් දක්වා ඉහළ ගොස් තිබුණි. ලැබිය යුතු අත්තිකාරම් සියයට 152 කින් ඉහළයාම ජංගම අනුපාතයේ ඉහළයාමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබූ අතර එම අත්තිකාරම් තුළ කොන්ත්‍රාත් සඳහා ලබාදී තිබුණු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් රු.480,929,665 ක් හෙවත් මුලු ජංගම වත්කම්වලින් සියයට 74 ක් ඇතුලත් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1. කාර්යසාධනය

#### 4.1.1 සැලසුම්කිරීම

සේනාංකය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබූ නමුත්, 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4 ඡේදය ප්‍රකාරව අන්තර්ගත කළ යුතු කරුණු ඇතුලත් කර එම සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

#### 4.1.2. ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම අනුව, ප්‍රධාන ක්‍රියාකාරකම් 23 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් සකස් කර තිබුණු අතර ප්‍රගති වාර්තාව අනුව ප්‍රධාන ක්‍රියාකාරකම් 27 කට අදාලව ප්‍රගතිය දක්වා තිබූ අතර ඒ අනුව රු.මිලියන 2.24 ක් වැයකරමින් සැලසුම් නොකළ ක්‍රියාකාරකම් 4 ක් සිදුකර තිබුණි. තවද, සැලසුම් කර තිබුණු අයවැය ප්‍රතිපාදනය රු.මිලියන 2.28 ක්වූ ක්‍රියාකාරකම් 5ක් සිදුකර නොතිබූ අතර ක්‍රියාකාරී සැලැස්මෙන් බැහැරව හා අයවැය වෙන්කිරීම් ද සිදුකර නොතිබූ රු. මිලියන 2.72 ක්වූ ක්‍රියාකාරකම් 3ක් සිදුකර තිබුණි.

(ආ) 2002 අංක 21 දරන ජාතික යොවුන් සේනාංක පනතේ 3 වගන්තිය අනුව සේනාංකයේ අරමුණ වන්නේ සංවර්ධනය, රැකියා පුහුණුව සහ වෘත්තීය සංවර්ධනයයි. එම අරමුණ ඉටු කර ගැනීම සම්බන්ධයෙන් කරන ලද විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) ඉකුත් වර්ෂයේදී සේනාංකය විසින් පාඨමාලාවන් පැවැත්වීම පළමු කණ්ඩායම සඳහා ජනවාරි සිට ජුනි දක්වාත්, දෙවන කණ්ඩායම සඳහා ජුනි සිට දෙසැම්බර් දක්වාත් සිදුකර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේදී පළමු කණ්ඩායම 2017 ජනවාරි සිට ජුනි දක්වාද දෙවන කණ්ඩායම 2017 සැප්තැම්බර් සිට 2018 පෙබරවාරි දක්වා කාලසීමාවන්වලදී පවත්වා යහපත් වර්ධනයක් ලබාගෙන තිබුණි. එහෙත් පාඨමාලා කාලසීමාවන් වෙනස් කිරීම සඳහා වූ විධිමත් ලිඛිත අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී මධ්‍යස්ථාන 49 සඳහා කණ්ඩායම් දෙකට සිසුන් 13,811 ක් බඳවා ගෙන තිබූ අතර ඉන් 4,167 ක් පාඨමාලාව හැරගොස් තිබුණි. ඒ අනුව පාඨමාලාව සම්පූර්ණ කළ සංඛ්‍යාව 9,644 ක්වූ අතර එය බඳවා ගත් පුහුණුලාභීන්ගෙන් සියයට 70 ක් පමණක් බව නිරීක්ෂණය විය.

(iii) ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය සඳහා නිපුණතා පරීක්ෂණය (NVQ) පැවැත්වීම සඳහා රු.2,829,467ක් වැය කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී පළමු කණ්ඩායමින් මධ්‍යස්ථාන 34 ක ඇගයීම් සඳහා පුහුණුලාභීන් 5,205 ක් පෙනී සිට ඉන් 4,866 ක් ඇගයීම් සමත් වී තිබූ අතර 4,604 දෙනෙකුට පමණක් සහතිකපත් හිමි වී තිබුණි. දෙවන කණ්ඩායම සඳහා Building Career Skills විෂය නිර්දේශය යටතේ මධ්‍යස්ථාන 33 ක පුහුණුලාභීන් 1,818 ක් ඇගයීම් සඳහා පෙනී සිට ඉන් 1,601 දෙනෙකු ඇගයීම් සමත් වී ඇති අතර 574 කට පමණක් සහතිකපත් හිමි වී තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂය තුලදී සේනාංකය විසින් රු.11,126,000 ක් වැය කර සිසුන් 5,405 ක් වෘත්තීය පුහුණුව සඳහා යොමු කර තිබුණද සිසුන් 1,642 ක් පුහුණුව හැර ගොස් තිබුණි. නමුත් මෙම වෘත්තීය පුහුණුව සම්පූර්ණ කිරීම පිළිබඳ පසු විපරම් කිරීමේ ක්‍රමවේදයක් තිබුණද, පුහුණුව අවසන් කරන ලද පුහුණුලාභීන් නිවැරදිව ඒ තුලින් හඳුනාගත නොහැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

(v) සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාකාරකම් පදනම් කරගත් පුහුණු මධ්‍යස්ථානයක් වන නාවුල මධ්‍යස්ථානයේ (ABT Center) කණ්ඩායම් දෙකට අදාලව පුහුණුලාභීන් 7,166 දෙනෙකු පුහුණුව ලබා ඇති අතර ඒ සඳහා රු.10,791,884 ක වියදමක් දරා තිබුණි. තවද, බාහිර පාර්ශවයට අයත් පුද්ගලයින් 609 දෙනෙකු පුහුණුකර ඇති අතර ඒ සඳහා රු.814,984 ක වියදමක් දරා තිබූ අතර ඉන් රු.1,293,289 ක ආදායමක් ලබා ගෙන තිබුණි. නමුත් මෙම බාහිර පාර්ශවයන්ට පුහුණුව ලබාදීමට සහ මුදල් අයකර ගැනීම සඳහා ලිඛිත අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෙනත් ආයතනවලට අයත්, වටිනාකම රු.35,667,765 ක් වූ වාහන 10 ක් සේනාංකය විසින් භාවිතා කරමින් තිබූ නමුත් මෙම මෝටර් රථවල නෛතික අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ඇතුළත් මෝටර් රථ වටිනාකම තුල 2015 වර්ෂයේ සිට ධාවනයෙන් ඉවත්කරන ලද වටිනාකම රු.2,000,000 ක්වූ මෝටර් රථ 02 ක් හා 2017 වර්ෂයේදී ධාවනයෙන් ඉවත්කරන ලද වටිනාකම රු.1,000,000 ක්වූ මෝටර් රථයක් නිරීක්ෂණය වූ අතර එම මෝටර් රථ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි

## 4.3 අරමුදල් ඌන උපයෝජනය

---

චීන රජයේ ආධාර යටතේ චීන භාෂා විද්‍යාගාර 03 ක් දඹුල්ල, ගාල්ල සහ දික්වැල්ල යොවුන් සේනාංක මධ්‍යස්ථානවල ස්ථාපිත කිරීම සඳහා රු.මිලියන 13 ක් 2016 වර්ෂයේදී ලබාදී තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් එම කාර්ය ඉටුකිරීමෙන් තොරව මුදල් ගිණුමේ රඳවාගෙන තිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නව මධ්‍යස්ථානයන්ට අදාළව 2016 වර්ෂයේ මිලදී ගත් එකතු වටිනාකම රු.50,997,436 ක්වූ පරිගණක175 ක් හා දේශන ශාලා පුටු 4150 ක් ඇතුලුව අයිතම වර්ග 9 කට අදාළ භාණ්ඩ 2018 ජූනි 30 දින වන විට මාස 18 කට වැඩි කාලයක් ගබඩාවල නිෂ්ක්‍රීයව රඳවා තබා ගෙන තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) 2017 වර්ෂයේ නව මධ්‍යස්ථාන සඳහා මිලදී ගනු ලැබූ එකතු වටිනාකම රු.54,474,893 ක් වූ ත්‍රී රෝද රථ 25 ක්, දේශන ශාලා පුටු 4875 ක් ඇතුලු අයිතම වර්ග 7 කට අදාළ භාණ්ඩ මාස දහයකට අධික කාලයක් රත්මලාන ගබඩාවේද, රු.49,504,500 ක්වූ පරිගණක හා UPS යන්ත්‍ර 475 ක් කන්තලේ පුහුණු මධ්‍යස්ථානයේද, එකතු වටිනාකම රු.4,569,519 ක්වූ අයිතම වර්ග 20 කට අදාළ භාණ්ඩ යක්කල ප්‍රධාන ගබඩාවේ නිෂ්ක්‍රීයව පැවති බව නිරීක්ෂණය විය.

## 4.5 ආර්ථික නොවූ ගනුදෙනු

නව මධ්‍යස්ථාන 12 ක් ආරම්භ කිරීම අත්‍යවශ්‍ය හා හදිසි කටයුත්තක් ලෙස සලකා භාණ්ඩ මිලදී ගෙන තිබුණද එම මධ්‍යස්ථාන ආරම්භකිරීම සිදු නොවීම නිසා මිලදී ගත් භාණ්ඩ ගබඩාකර තැබීම වෙනුවෙන් ගබඩා කුළී රු.2,028,200 ක්ද, රක්ෂණ ගාස්තු රු.149,724ක් හා ආරක්ෂක සේවා ගාස්තු රු.338,817 ක් එනම් රු.2,516,741 ක අමතර ගෙවීමක් සිදුකර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 4.6 හඳුනාගන්නා ලද පාඩු

සමාලෝචිත වර්ෂය තුලදී රු.5,380,158 ක් පිරිවැය වූ ස්ථාවර වත්කම් තොගයක් වෙන්දේසි කිරීමෙන් රු.3,225,966 ක අලාභයක් සේනාංකයට සිදුවී තිබුණි. වෙන්දේසි කළ ස්ථාවර වත්කම්වල පිරිවැය තහවුරු කර ගැනීම සඳහා විස්තරාත්මක උපලේඛනයක් (ඉවත් කරන ලද වත්කම්වල මිලදී ගත් දිනය, පිරිවැය ආදිය) විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර එක් එක් මධ්‍යස්ථානවලට අදාලව වත්කම් කාණ්ඩ වශයෙන් පමණක් දක්වා තිබුණි.

## 4.7 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම් / දේපලවල ව්‍යාපෘති ආරම්භ කිරීම

සේනාංකය විසින් භාවිතා කරන ඉඩම්වල නෛතික අයිතිය පවරාගෙන නොතිබූ අතර නෛතික අයිතියක් නොතිබියදී ඉඩම් / දේපලවල සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා රු.121,269,140 ක් වැය කර තිබුණි.

## 4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට සේනාංකයේ අනුමත කාර්ය මණ්ඩලය 1039 ක් සහ තත්‍ය කාර්ය මණ්ඩලය 852 ක් වූ අතර අනුමත ස්ථිර කාර්ය මණ්ඩලයෙන් 118 ක් හා කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලයෙන් 68 ක් ඇතුලුව පුරප්පාඩු 186 ක් පැවතිණි.

(ආ) අනුමත කාර්ය මණ්ඩලය අනුව, සේනාංකයේ කාර්ය මණ්ඩලයේ ප්‍රධාන තනතුර වන "අධ්‍යක්ෂ" තනතුර ස්ථිර තනතුරක් වුවද ස්ථිර පත්කිරීමක් සිදු නොකොට දිගින් දිගටම ද්විතික පදනම මත බඳවා ගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) 2017 වර්ෂය තුලදී ස්ථිර කාර්ය මණ්ඩලයේ 73 දෙනෙකු ඇතුලුව ආයතනයේ සේවකයින් 124 දෙනෙකු සේවය අතහැර ගොස් තිබුණි. මෙලෙස රැකියා හැරයාමේ ප්‍රවනතාව ඉහළ මට්ටමක පැවතීම, ආයතනයට පුහුණු ශ්‍රමය අහිමිවීමට මෙන්ම ආයතනයේ කාර්යක්ෂමතාවයටද අහිතකර ලෙස බලපෑ හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

--------------------------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපතිවරයා වෙත ගිණුම් ඉදිරිපත් කළයුතු වුවත් 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත්කර තිබුණේ 2018 නොවැම්බර් 26 දින දීය.

### 5.2 විගණන කමිටු

------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 හි 7.4.1 වගන්තිය ප්‍රකාරව, මාස තුනකට වරක්වත් විගණන කමිටුව පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී කමිටුව රැස්වී තිබුණේ එක් වතාවක් පමණි.

### 5.3 ප්‍රසම්පාදනයන් හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

-----------------------------------------------

#### 5.3.1 ප්‍රසම්පාදනයන්

-------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 ඡේදය හා ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 4.2.3 ඡේදය අනුව ප්‍රසම්පාදන කාලසටහන සකස්කර නොතිබුණි.

(ආ) නව පුහුණු මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය උපකරණ සපයා ගැනීමට කාණ්ඩ 12 ක් යටතේ අයිතම වර්ග 62 ක් සපයාගැනීම සඳහා 2017 සැප්තැම්බර් 15 දින පුවත්පත් දැන්වීමක් මගින් ලංසු කැඳවා තිබුණු බව නිරීක්ෂණය විය. නියැදි විගණන පරීක්ෂාවට අනුව පරිගණක, කාර්යාල උපකරණ හා භෝජනාගාර උපකරණ සපයා ගැනීම වෙනුවෙන් සිදුකර තිබූ රු.79,031,360 ක ප්‍රසම්පාදන කටයුතුවලදී ප්‍රසම්පාදන කාර්යය සංග්‍රහය හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල නොවූ අවස්ථා පහත පරිදි විය.

(i) ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 2.7.5 ඡේදය අනුව ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටු පත්කිරීම සම්බන්ධයෙන් ඉල්ලුම් කිරීමේදී අදාල ආකෘති භාවිතා කර නොතිබුණු අතර එම කමිටු සඳහා අමාත්‍යාංශ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1 (ii) ඡේදය ප්‍රකාරව, තාක්ෂණික ඇගයීමේ කමිටුවල වගකීම හා කාර්යභාරයක් වූ පිරිවිතර ස්වභාවයෙන් උත්පාදනය බවටත්, සමාන මට්ටමකින් තරඟකාරී බව ප්‍රවර්ධනය කළ හැකි බවටත්, සහතික වීම පිණිස පිරිවිතර සමාලෝචනය කිරීම හා අනුමත කිරීම සිදුකළ යුතු වුවද, එලෙස කටයුතු කර නොතිබුණි.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ඡේදය අනුව ජාතික තරඟකාරී ලංසු කැඳවීම සඳහා අවම වශයෙන් දින 21 ක් ලබාදිය යුතු වුවත් පුවත්පත් නිවේදනය අනුව ලංසු ඉදිරිපත් කිරීම සඳහා ලබාදී තිබුණේ දින 15 ක් පමණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 ඡේදය ප්‍රකාරව වැට් බදු ආවරණය කිරීම සඳහා මුදල් ගෙවීමෙන් පසු, ඊළඟ මාසයේ 15 වන දින හෝ එදිනට පෙර එකී ගෙවීම් පිළිබඳ විස්තර විගණකාධිපතිවරයාට ද පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම්දිය යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 5.3.2 ප්‍රමාද වූ ව්‍යාපෘති

--------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දින වන විට ඉදිකිරීම් 126 කට අදාලව රු.3,600,864,172 ක් වටිනා කොන්ත්‍රාත්, පෞද්ගලික ආයතන 16 කට සහ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයට පිරිනමා තිබුණි. ඒ අතුරින්, ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයට 2016 වර්ෂයේදී හා 2017 වර්ෂයේදී පිරිනමා තිබූ පිළිවෙලින් 41 ක් හා 31 ක් වශයෙන් වූ වටිනාකම රු.1,241,581,512 ක්වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 72 ක කොන්ත්‍රාත්තු කාලය දින 91 ක් වුවත්, අවස්ථා 10 කදී එම කොන්ත්‍රාත්තු කාලය දීර්ඝ කිරීම් සිදුකර තිබුණු අතර විගණිත දිනය වූ 2018 ඔක්තෝබර් 10 වන දින වන විටත් එම ඉදිකිරීම් අවසන් කර සේනාංකයට භාරදී නොමැති බව විගණනයට නිරීක්ෂණය විය.

(ආ) 2017 දෙසැම්බර් 31 දින වන විට පිරිනමා තිබූ කොන්ත්‍රාත් 12 කට අදාලව ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණු අතර ඉන් කොන්ත්‍රාත් 10 ක් සඳහා අත්තිකාරම් වශයෙන් රු. 104,899,479 ක් සේනාංකය විසින් ගෙවා තිබුණි.

## 5.4 අයවැය ලේඛනමය පාලනය

----------------------------------

සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 11 ක ඇස්තමේන්තුගත හා තත්‍ය සංඛ්‍යා අතර සියයට 78 සිට සියයට 100 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 5.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

-----------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ප්‍රකාරව 2015 හා 2016 වර්ෂ සඳහා වූ වාර්ෂික වාර්තා මෙම වාර්තාවේ දින වනවිටත් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සේනාංකයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | විධිමත් ගිණුම්කරණ පද්ධතියක් යොදා නොගැනීම. |
| (ආ) | ඉන්වෙන්ට්‍රි පාලනය | ඉන්වෙන්ට්‍රි ලේඛන විධිමත්පරිදි පවත්වාගෙන නොයෑම. |
| (ඇ) | අයවැය පාලනය | වැය විෂයයන් සඳහා ඇස්තමේන්තු කරන ලද වියදම් හා තත්‍ය වියදම් අතර විචලනයන් පැවතීම. |
| (ඈ) | තොරතුරු පද්ධති පවත්වාගැනීම | හඳුන්වා දී ඇති තොරතුරු පද්ධතිය මගින් යාවත්කාලීන කරන ලද තොරතුරු පහසුවෙන් හා ඉක්මණින් ලබාගත නොහැකි වීම. |

| | | |
|---|---|---|
| (ඉ) | ප්‍රසම්පාදනයන් | අවිධිමත් ප්‍රසම්පාදන ලිපිගොනු නඩත්තුව හා ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අඩුපාඩු පැවතීම. |
| (ඊ) | ගබඩා පාලනය | ප්‍රමාණවත් හා විධිමත් ගබඩා පාලන ක්‍රම හඳුන්වා දී නොමැති වීම. |